# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

## - පුරප්පාඩු -

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ, අධ්‍යක්ෂ (ඉංජිනේරු), අධ්‍යක්ෂ (මුදල්), නීති නිලධාරී සහ සංස්ථා මණ්ඩල ලේකම්, ඉංජිනේරු (තොරතුරු තාක්ෂණ), ඉංජිනේරු (සන්නිවේදන) සහ වාදක මණ්ඩල නායක යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත්, ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01 අධ්‍යක්ෂ ඉංජිනේරු (සම්ප්‍රේෂණ)**
(Director Engineer - Transmission) **තනතුරු 01 යි.**

- අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද: (පහත 1 හෝ 2)

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යුත් සන්නිවේදන (Electronic & Telecommunication) පිළිබඳ ඉංජිනේරු උපාධියක් ලබා තිබීම සමග තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබාගත් පසුව රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

**2.** තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබාගත් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

- වයස් සීමාව (අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.)
  (දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- වැටුප් (HM 1-1 රු 140,640 - 202,140 (4100x15)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**02. අධ්‍යක්ෂ (මුදල්)**
(Director Finance) **තනතුරු 01 යි.**

- අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද: (පහත 1 හෝ 2)

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය / වාණිජ්‍යය / ගණකාධිකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සමාජිකත්වය ලබාතිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබාගත් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

**2.** තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබාගත් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

- වයස් සීමාව (අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.)
  (දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- වැටුප් (HM 1-1 රු 140,640 - 202,140 (4100 x15)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**03. නීති නිලධාරී සහ සංස්ථා මණ්ඩල ලේකම්**
(Legal Office & Board Secretary) **තනතුරු 01 යි.**

- අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් ලබාතිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

සමඟ

ඉහත සුදුසුකම් ලබාගැනීමෙන් පසු අධිකරණ ක්‍රියාවලිය තුළ වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

- වයස් සීමාව (අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.)
  (දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- වැටුප් (MM 1-1 රු 91,690-168,240 (2,480 x10 - 3,450 x15)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**04. ඉංජිනේරු (තොරතුරු තාක්ෂණ)**
(Engineer – Information Technology) **තනතුරු 01 යි.**

- අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු උපාධියක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

- වයස් සීමාව (අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.)
  (දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- වැටුප (MM 1-1 රු 91,690-168,240 (2,480 x10 - 3,450 x15)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**05. ඉංජිනේරු (සන්නිවේදන)**
(Engineer - Communication) **තනතුරු 01 යි.**

- අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යුත් සහ සන්නිවේදන (Electronμc and Telecommunication) පිළිබඳ ඉංජිනේරු උපාධියක්

සහ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

- වයස් සීමාව (අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.)
  (දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- වැටුප් (MM 1-1 රු 91,690-168,240 (2,480 x10 - 3,450 x15)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**06. වාදක මණ්ඩල නායක**
(Orchestra Leader) **තනතුරු 01 යි.**

- අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංගීතය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

- වයස් සීමාව (අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.)
  (දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- වැටුප් (JM 1-1 රු 72,650 - 122,970(1,360 x10 - 2,040 x18)
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

එක් එක් තනතුර සඳහා බඳවාගැනීම්, අනුමත බඳවාගැනීම් පරිපාටි අනුව සිදුකෙරේ.

සියලුම විස්තර සහිතව සකස්කරන ලද අයදුම්පතක් සහතික පිටපත්ද සහිතව, කොළඹ 07, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2025.05.17 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. දෙපාර්තමේන්තු/සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, කොළඹ 07.**